**නම: ..............................................................**

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න**
- **අංක 01- 05 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) පාරම්පරික ශිල්ප ඥානය මත පදනම් වූ කර්මාන්තයක් **නොවන්නේ**,

   i. වෙස්මුහුණු   iii. පිඟන්
   ii. පිත්තල භාණ්ඩ   iv. පැදුරු

2) ශ්‍රී ලංකාවේ උතුරු පළාතට අයත් දිස්ත්‍රික්කය කුමක්ද?

   i. යාපනය   iii. පුත්තලම
   ii. අනුරාධපුරය   iv. ත්‍රිකුණාමලය

3) ශ්‍රී ලංකාවේ අඩු ම උෂ්ණත්වයක් වර්තාවන දිස්ත්‍රික්කය කුමක්ද?

   i. මන්නාරම   ii. නුවරඑළිය   iii. මාතලේ   iv. ගාල්ල

4) ශ්‍රී ලාංකිකයන් පොදුවේ වැඳුම් පිදුම් සඳහා සහාභාගී වන ස්ථානයකි,

   i. කෝනේෂ්වරම් කෝවිල   iii. කතරගම
   ii. ශ්‍රී පාදය   iv. ශ්‍රී මහා බෝධිය

5) රජය මඟින් නොමිලේ සපයන පොදු සේවාවක් වන්නේ,

   i. දුරකථන   iii. ගුවන් විදුලිය
   ii. ජලය   iv. සෞඛ්‍ය

- **ප්‍රශ්න අංක 6 - 10 දක්වා ඇති වගන්ති වලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

6) පාසල පිහිටි කුඩා ම පරිපාලන ඒකකය ............................................................ කොට්ඨාසය වේ.
7) නිවැරදිව දිශාව හඳුනා ගැනීම සඳහා .................................................... උපයෝගී කරගනු ලැබේ.
8) කෙටි කාලයක් තුළ වායු ගෝලයේ පවතින ස්වභාවය ......................................... ලෙස හැඳින්වේ.
9) වර්ෂාව මැනීම සඳහා ....................................... නැමැති ඒකකය යොදා ගනු ලබයි.
10) භූ දර්ශනයේ ඇති උස්බිම්, වනාන්තර, ගංගා ............................. නිර්මාණය වූ භූගෝලීය ලක්ෂණ වේ.

- **පහත සඳහන් වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන තුළ යොදන්න.**

11) බත් කුරා කුඹුරුවලට හානි කරන කෘමීන් විනාශ කරයි. ( )

12) සිවුරු හොරා, අවිච්චියා සංචාරක පක්ෂීන් වේ. ( )

13) දීපවාලී උත්සවය ඉස්ලාම් ආගමික උත්සවයකි. ( )

14) කැලණි ගං මිටියාවත දුම්කොල වගාව සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. ( )

15) පාසැල් සිසුන් ගේ ප්‍රවාහනය සඳහා රජය විසින් සහනදායි මිලට වාර ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබයි. ( )

- **(අ) තීරුවේ දැක්වෙන ප්‍රදේශයට අදාළ කර්මාන්ත (ආ) තීරුවෙන් තෝරා යා කරන්න.**

| (අ) | (ආ) |
|---|---|
| 16) ලී බඩු | A - දුම්බර |
| 17) වෙස් මුහුණු | B - හික්කඩුව |
| 18) පිත්තල භාණ්ඩ | C - රදාවඩුන්න |
| 19) වේවැල් භාණ්ඩ | D - බලපිටිය |
| 20) පැදුරු | E - අම්බලන්ගොඩ |
| | F - මොරටුව |

(ලකුණු 20x2=40)

## II කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

1)

i. ඔබ නිවස අවට සිදුකරනු ලබන ආර්ථික කටයුතු 3 ක් නම් කරන්න. (ල. 03)

ii. පහත ප්‍රදේශවලට සුවිශේෂී වූ කෘෂිකාර්මික භෝග එක බැගින් නම් කරන්න.

- වියළි කලාපය-
- කඳුකර කලාපය-
- තෙත් කලාපය-
- උතුරු ප්‍රදේශය- (ල. 04)

iii. රජය විසින් පාසල් සිසුන්ට නොමිලේ ලබා දෙන සේවාවන් 2 ක් නම් කර එයින් ඔබ ලබන ප්‍රයෝජන විස්තර කරන්න. (ල. 05)

2)

i. ඔබේ පාසල පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, දිස්ත්‍රික්කය හා පළාත නම් කරන්න. (ල. 03)

ii. දිශාව හඳුනාගැනීමේ දිශා සටහනක් ඇඳ නම් කරන්න. (ල. 04)

iii. පාසලේ දළ සැලැස්ම ඇඳ පාසල් ගොඩනැගිලි නම් කරන්න. (ල. 05)

3)

i. ඔබ ප්‍රදේශයේ භූමිය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා 3 ක් නම් කරන්න. (ල. 03)

ii. අවිධිමත්ව භූමිය පරිහරණය කරන අවස්ථා 4 ක් ලියන්න. (ල. 04)

iii. නිවාස අවට භූමිය විධිමත්ව පරිහරණය කිරීම සඳහා ගත යුතු පියවර 3 ක් විස්තර කරන්න.(ල. 05)

4)

i. පාසල අවට වටපිටාවේ ජීවත් වන ජන වර්ග 3 ක් ලියන්න. (ල. 03)

ii. අප රටේ අදහන ප්‍රධාන ආගම් හතරෙහි ආගමික සංකේත ඇඳ නම් කරන්න. (ල. 04)

iii. ඔබ ප්‍රදේශයේ පොදු කටයුතුවලදී ප්‍රජාව සාමූහිකව එකතුවී කටයුතු කිරීමේ වැදගත්කම විස්තර කරන්න. (ල. 05)

5)

i. බස්නාහිර පළාතට අයත් වන දිස්ත්‍රික්ක නම් කරන්න. (ල. 03)

ii. සතුන්ගෙන් හා ශාකවලින් පරිසරයට ලැබෙන ප්‍රයෝජන 4 ක් ලියන්න. (ල. 04)

iii. පහත ස්ථාන ශ්‍රී ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න.

- කැළණි ගඟ.
- දෙවුන්දර තුඩුව.
- මහනුවර.
- අනුරාධපුරය.
- ත්‍රිකුණාමලය. (ල. 05)

